සැ. යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2019 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,110 - 2019 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා - 2019.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 362 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 370 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මාර්තු මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 පෙබරවාරි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

සංශෝධනයයි

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දෙමළ භාෂාවෙන් උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - කොළඹ දිස්ත්‍රික්කය

අංක 2086 හා 2018.08.31 දිනැති *ගැසට්* පත්‍රයෙහි මවිසින් පළකරන ලද 08-948 දැන්වීමෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) ලෙස සංශෝධනය කරමි. එහි අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2019.03.08 වන දා දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කොළඹ | තිඹිරිගස්යාය | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ. |

02-184

---

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

### තනතුරු පුරප්පාඩු

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :

| තනතුර | පුරප්පාඩු ගණන |
|---|---|
| පරිගණක දත්ත ක්‍රියාකරු | 04 |
| ව්‍යාපෘති සම්බන්ධීකාරක | 01 |
| පොත් ගබඩා භාරකරු | 01 |

02. *සේවයේ නියුක්ත කිරීම සහ සේවා කොන්දේසි*
මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරු සඳහා හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

වැටුප් කේත අංකය : MN 01-2016

වැටුප් පරිමාණය : රු. 27,140- 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540

03. සුදුසුකම් :

I. අධ්‍යාපන සුදුසුකම් :

(අ) මාධ්‍ය භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර විෂයයන් 06 කින් සමත්වීම.

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අනෙක් විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක්වත් සමත්ව තිබීම.

සහ

(ඇ) 1. *ව්‍යාපෘති සම්බන්ධීකාරක* - රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 04 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

2. පරිගණක දත්ත ක්‍රියාකරු - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පැය 720කට නොඅඩු පරිගණක පාඨමාලාවක් සම්පූර්ණ කර සහතික ලබා තිබීම.

ii. *වෘත්තීය සුදුසුකම්* :පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය/ලඝු ලේඛනය පිළිබඳ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

iii. *පළපුරුද්ද* : අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

iv. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

v. *වෙනත් සුදුසුකම්* :
1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

04. *වයස් සීමාව* : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
(දැනට රාජ්‍ය සේවයේ නියුක්තවූවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

05. බඳවා ගැනීමේ ක්‍රමය :
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් නියම කරන පරිදි යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත බඳවා ගනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම් පරීක්ෂා කර බලා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව බඳවා ගනු ලැබේ.

* යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| 3. අතිරේක පළපුරුද්ද | 30 | |
| 4. පරිගණක දැනුම | 15 | |
| 5. ඉංග්‍රීසි භාෂා දැනුම | 15 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

06. අයදුම්පත් පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව A4 (8.27 x 11.69) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර 2019.02.22 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.)

සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා :

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ............................. තනතුර සඳහා ඉල්ලුම් කිරීම**

01. මුලකුරු සමග නම :————.

02. සම්පූර්ණ නම :————.

03. උපන් දිනය :————.

04. වයස (2019.02.22 දිනට) : අවුරුදු :————.; මාස :————.; දින :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. ලිපිනය :————.

08. දුරකථන අංකය :————.

09. අධ්‍යාපන සුදුසුකම් :
i. අ.පො.ස. (සා/පෙළ)

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂය | ලබා ගත් සාමාර්ථය | විෂය | ලබාගත් සාමාර්ථය |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

ii. අ.පො.ස. (උ/පෙළ)

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂය | ලබාගත් සාමාර්ථය |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

10. වෘත්තීය සුදුසුකම් :

11. පළපුරුද්ද :
මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද , මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සකුවන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

02-420

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

**නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :
ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දීමෙන් අනතුරුව නීතිඥයෙකු වශයෙන් වසර 03 නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) වෙනත් :
- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය,
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය,
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිරය.

ii. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

iii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. නීති නිලධාරි III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iv. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව තනතුරට බැඳී වසර 5 ක් ඇතුළත ලබා ගත යුතුය.

v. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව* :
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය* :
2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1, 335 - 8 x 1,630 - 17 x 2,170 -රු. 110,895 (SL-1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | *අතිරේක අධ්‍යාපන සුදුසුකම්* : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය<br>- පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>- දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා<br>- දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා<br>**සටහන** - ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ක් ලබා දිය යුතුය.<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ. උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | <br><br>20<br>15<br>10<br>15<br><br>10 | 20 |
| 02 | *අතිරේක වෘත්තීය සුදුසුකම්* :<br><br>නීතිය පිළිබඳ ආචාර්ය උපාධිය<br><br>නීතිය පිළිබඳ වසරකට නොඅඩු පශ්චාත් උපාධිය<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින් - උපරිම ලකුණු 15)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින් - උපරිම ලකුණු15)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින් - උපරිම ලකුණු 10) | <br><br>15<br><br>10 | 15 |
| 03 | අතිරේක පළපුරුද්ද :<br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30 ක්<br>- මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02<br><br>(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයෙකු ලෙස කටයුතු කළ වසර 03 ක සේවා කාලය හැර)<br><br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මඟින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය. මුද්‍රාව යොදා තිබීම අනිවාර්ය වේ.) | | 30 |

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 04 | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක - අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 ක පාඨමාලාවක් සඳහා<br>- මාස 06/පැය 720<br>- මාස 03/පැය 360<br>(උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දේ.) | 15<br><br>10<br><br>07<br>05 | 15 |
| 05. | **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව**<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය<br>(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජය පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(වසර 01 ක් හෝ පැය 1500)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/පැය 720<br>- මාස 03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | 15<br><br>10<br><br>07<br>05 | 15 |
| 06. | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව** | | 05 |
| | **මුළු එකතුව** | | 100 |

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය

(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

(අ) අයදුම්පත් 2019.03.08 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කල යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

(ආ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ, ''ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඇ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී ලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 47,615 කට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(ඈ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඉ) ඉදිරිපත් කල යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටු අංක 01 සිට 08 දක්වාත් දෙවන පිටුව අංක 09 සිට 13 දක්වාත් තෙවන පිටුව 14 සිට 15.2 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

09. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මුලකුරු සමඟ නම (මයා/මිය/මෙනවිය) :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

01.1 මුලකුරු වලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

03.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ -M , ස්ත්‍රී - F)

05. විවාහක/අවිවාහක බව :————.

06. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) : ..........................................................................
..........................................................................
..........................................................................

07. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

08. නීති උපාධිය පිළිබඳ විස්තර :
(i) විශ්වවිද්‍යාලය :————.

(ii) උපාධිය පිරිනැමූ දිනය :————.

09. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

10. නීතිඥයකු ලෙස සක්‍රීය පළපුරුද්ද (වසර ගණන) :————.

11. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 06 ඡේදය අනුව සුදුසුකම් ෘ

(i) ..........................................................................

(ii) ..........................................................................

(iii) ..........................................................................

(iv) ..........................................................................

(v) ..........................................................................

12. ඔබ කවරදා හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
ඔව්/නැත
12.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න.

13. අයදුම්කරුගේ සහතිකය ෘ
(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.
(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ෘ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................ නැමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............ දින මා ඉදිරිපිට දී ඉහත 13 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ෘ (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

15.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුල, වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.
සියලු වැටුප් වර්ධක උපයා ඇත/නැත
කිසිදු විනය දඬුවමකට ලක් වී නැත/ඇත.

15.2 ඉල්ලුම් කරනු ලබන තනතුරකට තෝරා ගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/නොහැකිය. ඉල්ලුම්පත්‍රය නිර්දේශ කරමි/නොකරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

දිනය :————.

02-260

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019**

1.0 ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් සහ පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 2019 මැයි මාසයේ දී පවත්වනු ලබන බවත් ඒ සඳහා අයදුම්පත් කැඳවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවල දී පමණක් පැවැත්වේ. එම නගරවලට අදාළ නගර අංක පහත වගුවේ දැක්වේ. අයදුම් පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතු වේ. ඉල්ලුම් කළ නගරය/ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ඉහත සඳහන් යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයදුම්කරුවන් යොමු කෙරෙනු ඇත.

තව ද, යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |
| මන්නාරම | 06 |
| මුලතිව් | 07 |
| ත්‍රිකුණාමලය | 08 |
| මඩකලපුව | 09 |
| කුරුණෑගල | 10 |
| අනුරාධපුර | 11 |
| බදුල්ල | 12 |
| රත්නපුර | 13 |
| කිලිනොච්චි | 14 |

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා අයත් දිස්ත්‍රික්කය පිළිබඳ තොරතුරු 01 වැනි උපලේඛනයේ දැක්වේ. අයදුම්කරුවන් තමා ඉල්ලුම් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා එහි අංකයත්, දිස්ත්‍රික්කය හා එහි අංකයත් එම උපලේඛනයේ සඳහන් පරිදි නිවැරදිව අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතු ය. එය පසු අවස්ථාවක වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එම විස්තර වැරදි ලෙස සටහන් කිරීම හේතුවෙන් අයදුම්කරුවකුට සිදුවන කිසියම් අවාසියක් සම්බන්ධ කිසිදු ඉල්ලීමක් සලකා නොලබන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා කොට්ඨාස අංකය සඳහන් කර නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්, විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 *සුදුසුකම්* .- 2010.09.29 දින සිට ක්‍රියාත්මක ග්‍රාම නිලධාරි බඳවා ගැනීමේ පටිපාටිය අනුව ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරින් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

5.0 *විභාග පටිපාටිය* : අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| *විෂය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 1. කාර්යාල ක්‍රම හා ගිණුම් | 01 | 100 යි | පැය 02 යි |
| 2. විෂයානුබද්ධ වෘත්තීය දැනුම | 02 | 100 යි | පැය 02 යි |
| 3. පරිගණක පරීක්ෂණය | 03 | 100 යි | පැය 01 1/2 යි |

5.1 **කාර්යාල ක්‍රම හා ගිණුම් (විෂය අංකය - 01)**

*කාර්යාල ක්‍රම* :

ග්‍රාම නිලධාරි කාර්යාලයේ හා රජයේ කාර්යාලවල භාවිතවන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ විෂයානුබද්ධ කරුණු සම්බන්ධව වාර්තාවක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද පරීක්ෂා කෙරේ.

*ගිණුම්* :

ග්‍රාම නිලධාරි වෙත පැවරී ඇති රාජකාරිවලට අදාළ හා රජයේ කාර්යාලවල භාවිතවන මූලික ගිණුම් හා ගිණුම් ක්‍රම ද, මුදල්

පාලන පොත්වල කාර්යයන්, ප්‍රසම්පාදන පිළිබඳව ද අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ.

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25යි)

II වන කොටස - ප්‍රශ්න තුනකින් සමන්විත ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75යි)

5.2 විෂයානුබද්ධ වෘත්තීය දැනුම ( විෂයය අංකය - 02)

ග්‍රාම නිලධාරීන්ට අදාළ විවිධ අණපනත් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් රජයේ ව්‍යවස්ථාපිත ආයතන මගින් පැවරී ඇති රාජකාරි පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 25යි)

II වන කොටස - ප්‍රශ්න තුනකින් සමන්විත ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 75යි)

5.3 පරිගණක පරීක්ෂණය (විෂයය අංක - 03)

අයදුම්කරුට පහත සඳහන් හැකියාවන් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ.

| | |
|---|---|
| | තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප,<br>මෙහෙයුම් පද්ධති,<br>ගොනු කළමනාකරණය. |
| වදන් සැකසුම : | මූලික කුසලතා, තිරයට හුරුවීම, පාඨ සංස්කරණය, පාඨ එකේලි කිරීම, අකුරු වර්ග හා උප ලක්ෂණ, අනුඡේද, ඡේද, පේළි අතර පරතරය වෙනස් කිරීම, පිමි අනුයෝගය (Tab Settings), පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය, අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද,<br>තීරු යෙදීම, පිටුව සැකසීම,<br>ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය,<br>අනුපිළිවෙළට සැකසීම,<br>ගොනු කළමණාකරණය,<br>ලේඛනයක් ලිපිනයන් කිහිපයකට යැවීමට සැකසීම,<br>මැක්‍රෝ භාවිතය, |
| පැතුරුම් පත් : | මූලික කුසලතා,<br>ආකෘතිකරණය ( Formatting),<br>සංස්කරණය,<br>තීරු හා පරාස, නව ඇතුළත් කිරීම් හා ඉවත් කිරීම්,<br>දත්ත අනුපිළිවෙළට සැකසීම,<br>ප්‍රස්තාර සැකසීම,<br>මුද්‍රණය,<br>@ ශ්‍රිත (@ Functions)<br>මැක්‍රෝ භාවිතය, ගොනු කළමනාකරණය |
| දත්ත සමුදාය : | හැඳින්වීම, මූලික කුසලතා,<br>දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය,<br>ආකෘති,<br>සන්ධානගත ආකෘති, උත්පතන ආකෘති (popup forms)<br>විමසුම් (queries)<br>අනුපිළිවෙළට සැකසීම,<br>වාර්තා ලබා ගැනීම,<br>මැක්‍රෝ භාවිතය, |
| ඉදිරිපත් කිරීම්/චිත්‍ර සටහන් : | මූලික කුසලතා, සංස්කරණය,<br>ආකෘතිකරණය, සැලසුම් යෙදීම,<br>අනුරූප, පසුරු සිත්තම් හා ප්‍රස්තාර නිවේශනය,<br>කදා මාරුව හා සජීවකරණය, ඉදිරිපත් කිරීමේ මෙවලම් භාවිතය, ගුරු (Master) කදාව සැකසීම,<br>කදා මුද්‍රණය හා සටහන් |
| අන්තර්ජාලය : | අන්තර්ජාලය හැඳින්වීම, විශ්ව විසිරි ජාලය,<br>මං සොයන ආකාරය,<br>ව්‍යවහාරික අන්තර්ජාලය |
| විද්‍යුත් තැපෑල : (E-Mail) | හැඳින්වීම, මූලික කුසලතා, විද්‍යුත් තැපෑල ලබා ගැනීම, විද්‍යුත් තැපෑල යැවීම හා ඊට ප්‍රතිචාර දැක්වීම. ඇමුණුම් භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය, පණිවුඩ සම්පාදනය |

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වැනි කොටස - බහුවරණ/ කෙටි පිළිතුරු ප්‍රශ්න 40 කින් යුක්ත වේ. (ලකුණු 40 යි)

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 05 කි. (ලකුණු 60 යි)

I හා II යන කොටස් දෙකටම නියමිත කාලය පැය 1 1/2 කි.

*සටහන.*—2010.09.29 දිනැති ග්‍රාම නිලධාරි බඳවා ගැනීම් පටිපාටියේ ඇමුණුම් 02 හි 08 වැනි ඡේදයට අනුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක මෙහෙයුම් බලපත්‍රය හෝ පරිගණක මෙහෙයුම්

බලපත්‍රයට සමාන හෝ ඊට ඉහළ ගුණාත්මක අගයක් ඇති තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනවලින් නිකුත් කරන ලද පරිගණක පිළිබඳ සහතිකපත්‍ර ලබා ඇති නිලධරයන් මෙම පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ. තව ද, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක යෙදවුම් සහායක (NVQ මට්ටම 3) සහතිකය ලබා ඇති නිලධරයන් මෙම පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

ඉහත පාඨමාලාවන්ට අමතරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යා/තොරතුරු තාක්ෂණ උපාධිය හෝ උපාධිය සඳහා පරිගණක විද්‍යා/තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදරා ඇති නිලධාරින් ග්‍රාම නිලධාරි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙහි පරිගණක පරීක්ෂණයෙන් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

6.0 සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එසේකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින්වත් ලබාගත යුතු වේ. සියලු විෂයයන් සමත් වී විභාගය සම්පූර්ණ කරනු ලබන වර්ෂයේ විභාගය පවත්වන ලද අවසාන දිනය මෙම කාර්යක්ෂමතා කඩ ඉම සමත් වූ දිනය ලෙස සලකනු ලැබේ.

8.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් මා වෙත නිකුත් කරන අතර, විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් අයදුම්කරුවන්ට දැන්වීමට කටයුතු කරනු ඇත.

9.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් තම සේවා වසමට අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා මඟින් 2019 මාර්තු මස 11 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

10.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව*.- අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය සමඟ පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය :-

(i) ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,

(iii) වලංගු රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11.0 *අයදුම්පත්‍ර*.—ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 4.0 දක්වා ඡේදයන් පළමුවන පිටුවට ද, 5.0 සිට 7.0 දෙවන පිටුවට ද, ඇතුළත් වන පරිදි "ඒ 4" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතු ය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත්‍රය මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පත්‍රයක් පමණක් වන අතර අයදුම්පත්‍රයේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12.0 පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට හෝ විෂයයන් දෙකක් සඳහා පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 500/- ක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 250/- ක් ද වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයදුම්කරුගේ නමින්ම ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

13.0 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවන් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ලඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

13.1 විභාග ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය.

14.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

15.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවන අතර, මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති මෙම විෂයට අදාළ කවර කරුණක් පිළිබඳ වුව ද මාගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එච්. ටී. කමල් පත්මසිරි,
ලේකම්,
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු
සහ පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.

2019 ජනවාරි මස 19 වැනි දින,
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

*ග්‍රාම නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019*

**EFFICIENCY BAR EXAMINATION AND A WRITTEN TEST IN COMPUTER SKILLS FOR THE OFFICERS IN CLASS III OF GRAMA NILADHARI SERVICE - 2019**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : ☐
සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න
මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| | විභාගයට ඉල්ලුම් කරන නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(*ගැසට්* නිවේදනයේ 2.0 ඡේදයට අනුව
විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර කැමැත්ත
අනුව අනුපිළිවෙලින් දක්වන්න.
මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

1.0 1.1 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : (උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොද නම: (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):————.
(උදා. : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

2.0 2.1 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 සේවය කරනු ලබන දිස්ත්‍රික්කය සහ දිස්ත්‍රික්ක අංකය :————. ☐☐
(උපලේඛනය I අනුව යොදන්න.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 සේවය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය :————. ☐☐☐☐
(උපලේඛනය I අනුව යොදන්න.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 සේවය කරනු ලබන දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.0 3.1 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.2 ස්ත්‍රී/ පුරුෂභාවය : ☐

ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.3 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.4 ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

4.0 ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/ විෂයයන් (*ගැසට්* නිවේදනයේ 05 වැනි ඡේදය බලන්න)

| *අනු. අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |

5.0 5.1 අයත් වන ශ්‍රේණිය :————.
5.2 තනතුර :————.
5.3 අදාළ ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

6.0 *සැළකිය යුතුයි :- ගැසට් පත්‍රයේ* දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල් ගෙවූ බවට තැපැල්/උපතැපැල් කාර්යාලයෙන් අයදුම්කරුගේ නමින්ම ලබා ගත් කුවිතාන්සිය මෙහි නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

| |
|---|
| |

කුවිතාන්සි අංකය :————.
තැපැල්/උපතැපැල් කාර්යාලය :————.
දිනය :————.
මුදල රුපියල් :————.

7.0 ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. එසේම එම විභාගය සඳහා පළමුවරට ඉදිරිපත් වන බව ද/ විභාගයට නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

—————,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :—————.

**ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය**

………… ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ………… ග්‍රාම නිලධාරි වසමේ සේවයේ නියුතු ග්‍රාම නිලධාරි/ ග්‍රාම නිලධාරිනි, …………………… මහතා/ මහත්මිය/ මෙනෙවිය විසින්,

(i) මා ඉදිරියේ දී අත්සන් කළ බවත්,
(ii) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
(iii) නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,
(iv) පළමුවන වරට විභාගයට පෙනී සිටින බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවන ලද ලදුපත අලවා ඇති බවත්, මම සහතික කරමි.

(නොගැලපෙන වචන කපා හරින්න.)

—————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන
සහ නිලමුද්‍රාව.

නම :—————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.

උපලේඛනය **I**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| කොළඹ | 1103 | |
| කොලොන්නාව | 1106 | කොළඹ |
| කඩුවෙල | 1109 | |
| හෝමාගම | 1112 | |
| හංවැල්ල | 1115 | |
| පාදුක්ක | 1118 | 01 |
| මහරගම | 1121 | |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 1124 | |
| තිඹිරිගස්යාය | 1127 | |
| දෙහිවල | 1130 | |
| රත්මලාන | 1131 | |
| මොරටුව | 1133 | |
| කැස්බෑව | 1136 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| මීගමුව | 1203 | |
| කටාන | 1206 | ගම්පහ |
| දිවුලපිටිය | 1209 | |
| මීරිගම | 1212 | |
| මිනුවන්ගොඩ | 1215 | 02 |
| වත්තල | 1218 | |
| ජාඇල | 1221 | |
| ගම්පහ | 1224 | |
| අත්තනගල්ල | 1227 | |
| දොම්පේ | 1230 | |
| මහර | 1233 | |
| කැළණිය | 1236 | |
| බියගම | 1239 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| පානදුර | 1303 | |
| බණ්ඩාරගම | 1306 | |
| හොරණ | 1309 | කළුතර |
| ඉංගිරිය | 1310 | |
| බුලත්සිංහල | 1312 | |
| මදුරාවල | 1315 | |
| මිල්ලනිය | 1318 | 03 |
| කළුතර | 1321 | |
| බේරුවල | 1324 | |
| දොඩන්ගොඩ | 1327 | |
| මතුගම | 1330 | |
| අගලවත්ත | 1333 | |
| පාලින්දනුවර | 1336 | |
| වලල්ලාවිට | 1339 | |
| තුම්පනේ | 2103 | |
| පූජාපිටිය | 2106 | |
| අකුරණ | 2109 | මහනුවර |
| පාතදුම්බර | 2112 | |
| පන්විල | 2115 | |
| උඩුදුම්බර | 2118 | |
| මිනිපේ | 2121 | |
| මැදදුම්බර | 2124 | 04 |
| කුණ්ඩසාලේ | 2127 | |
| ගඟවට කෝරළේ | 2130 | |
| හාරිස්පත්තුව | 2133 | |
| හතරලියද්ද | 2134 | |
| යටිනුවර | 2136 | |
| උඩුනුවර | 2139 | |
| දොළුව | 2142 | |
| පාතහේවාහැට | 2145 | |
| දෙල්තොට | 2148 | |
| උඩපළාත | 2151 | |
| ගඟඉහල කෝරළේ | 2154 | |
| පස්බාගෙ කෝරළේ | 2157 | |
| ගලේවෙල | 2203 | |
| දඹුල්ල | 2206 | මාතලේ |
| නාඋල | 2209 | |
| පල්ලෙපොල | 2212 | |
| යටවත්ත | 2215 | 05 |
| මාතලේ | 2218 | |
| අඹන්ගඟ කෝරළේ | 2221 | |
| ලග්ගල පල්ලේගම | 2224 | |
| විල්ගමුව | 2227 | |
| රත්තොට | 2230 | |
| උකුවෙල | 2233 | |
| කොත්මලේ | 2303 | නුවරඑළිය |
| හඟුරන්කෙත | 2306 | |
| වලපනේ | 2309 | |
| නුවරඑළිය | 2312 | 06 |
| අඹගමුව | 2315 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| බෙන්තොට | 3103 | |
| බලපිටිය | 3106 | |
| කරන්දෙනිය | 3109 | ගාල්ල |
| ඇල්පිටිය | 3112 | |
| නියාගම | 3115 | |
| තවලම | 3118 | 07 |
| නෙළුව | 3121 | |
| නාගොඩ | 3124 | |
| බද්දේගම | 3127 | |
| වැලිවිටිය දිවිතුර | 3130 | |
| අම්බලන්ගොඩ | 3133 | |
| හික්කඩුව | 3136 | |
| කඩවත්සතර | 3139 | |
| බෝපෙ පෝද්දල | 3142 | |
| අක්මීමන | 3145 | |
| යක්කලමුල්ල | 3148 | |
| ඉමදූව | 3151 | |
| ගෝනපීනුවල | 3154 | |
| හබරාදුව | 3157 | |
| පිටබැද්දර | 3203 | |
| කොටපොල | 3206 | |
| පස්ගොඩ | 3209 | මාතර |
| මුලටියන | 3212 | |
| අතුරලිය | 3215 | |
| අකුරැස්ස | 3218 | 08 |
| වැලිපිටිය | 3221 | |
| මාලිම්බඩ | 3224 | |
| කඹුරුපිටිය | 3227 | |
| හක්මන | 3230 | |
| කිරින්ද පුහුලුවැල්ල | 3233 | |
| තිහගොඩ | 3236 | |
| වැලිගම | 3239 | |
| මාතර | 3242 | |
| දෙවිනුවර | 3245 | |
| දික්වැල්ල | 3248 | |
| සූරියවැව | 3303 | |
| ලුණුගම්වෙහෙර | 3306 | |
| තිස්සමහාරාමය | 3309 | හම්බන්තොට |
| හම්බන්තොට | 3312 | |
| අම්බලන්තොට | 3315 | |
| අඟුණකොලපැලැස්ස | 3318 | 09 |
| වීරකැටිය | 3321 | |
| කටුවන | 3324 | |
| ඕකේවෙල | 3327 | |
| බෙලිඅත්ත | 3330 | |
| තංගල්ල | 3333 | |
| වලස්මුල්ල | 3336 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| කයිට්ස් | 4103 | |
| චානක්කනි | 4106 | |
| සන්දිලිපායි | 4109 | යාපනය |
| තෙලිප්පායි | 4112 | |
| උඩුවිල් | 4115 | 10 |
| කෝපායි | 4118 | |
| කරවෙඩ්ඩි | 4121 | |
| මුරුතන්කර්නි | 4124 | |
| පොයින්ට් පේද්‍රු | 4127 | |
| චාවාකච්චේරි | 4130 | |
| නල්ලූර් | 4133 | |
| යාපනය | 4136 | |
| වෙලනායි | 4139 | |
| ඩෙල්ෆ් | 4142 | |
| කරෙයිනගර් | 4145 | |
| මන්නාරම | 4203 | |
| මාන්තායි බටහිර | 4206 | මන්නාරම |
| මඩු | 4209 | |
| නානද්දාන් | 4212 | 11 |
| මුසාලි | 4215 | |
| වවුනියා උතුර | 4303 | වවුනියා |
| වවුනියා දකුණ | 4306 | |
| වවුනියා | 4309 | 12 |
| වෙන්ගලචේඩිකුලම් | 4312 | |
| තුනුක්කායි | 4403 | |
| මාන්තායි නැගෙනහිර | 4406 | මුලතිව් |
| පුදුකුඩිඉරුප්පු | 4409 | |
| ඔඩ්ඩුසුඩාන් | 4412 | 13 |
| මැරිටයිම්පත්තු | 4415 | |
| වැලිඔය | 4418 | |
| පච්චිලෙයිපල්ලි | 4503 | කිලිනොච්චිය |
| කඳවලෙයි | 4506 | |
| කරච්චි | 4509 | 14 |
| පූනාකරි | 4512 | |
| කෝරළේපත්තු උතුර | 5103 | |
| කෝරළේපත්තු බටහිර | 5106 | |
| කෝරළේපත්තු | 5109 | |
| එරාවූර්පත්තු | 5112 | |
| එරාවූර් නගරය | 5115 | මඩකලපුව |
| මන්මුනේ උතුර | 5118 | |
| මන්මුනේ බටහිර | 5121 | 15 |
| කාත්තන්කුඩි | 5124 | |
| මන්මුනේපත්තු | 5127 | |
| මන්මුනේ නිරිත | 5130 | |
| පෝර්තිව්පත්තු | 5133 | |
| මන්මුනේ දකුණ | 5136 | |
| කෝරළේපත්තු දකුණ | 5139 | |
| කෝරළේපත්තු මධ්‍යම | 5142 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| දෙහිඅත්තකණ්ඩිය | 5203 | |
| පදියතලාව | 5206 | |
| මහඔය | 5209 | |
| උහන | 5212 | |
| අම්පාර | 5215 | |
| නාවින්දවේලි | 5216 | අම්පාර |
| සමන්තුරෙයි | 5218 | |
| කල්මුණේ දමිල | 5224 | 16 |
| සයින්ද මුරුදු | 5225 | |
| කාර්තිවු | 5227 | |
| නින්දවූර් | 5230 | |
| අඩ්ඩාලච්චේන | 5233 | |
| ඉරක්කාමම් | 5234 | |
| අක්කරපත්තුව | 5236 | |
| අලයඩිවෙම්බු | 5239 | |
| දමන | 5242 | |
| තිරුක්කෝවිල් | 5245 | |
| පොතුවිල් | 5248 | |
| ලාහුගල | 5251 | |
| කල්මුණේ මුස්ලිම් | 5254 | |
| පදවි ශ්‍රී පුර | 5303 | |
| කුච්චවේලි | 5306 | |
| ගෝමරන්කඩවල | 5309 | ත්‍රිකුණාමලය |
| මොරවැව | 5312 | |
| නගර හා කඩවත් | 5315 | |
| තඹලගමුව | 5318 | 17 |
| කන්තලේ | 5321 | |
| කින්නියා | 5324 | |
| මුතූර් | 5327 | |
| සේරුවිල | 5330 | |
| වෙරුගල්/ඉච්චලම්පත්තු | 5333 | |
| ගිරිබාව | 6103 | |
| ගල්ගමුව | 6106 | |
| ඇහැටුවැව | 6109 | |
| අඹන්පොල | 6112 | |
| කොටවෙහෙර | 6115 | කුරුණෑගල |
| රස්නායකපුර | 6118 | |
| නිකවැරටිය | 6121 | |
| මහව | 6124 | 18 |
| පොල්පිතිගම | 6127 | |
| ඉබ්බාගමුව | 6130 | |
| ගනේවත්ත | 6133 | |
| වාරියපොල | 6136 | |
| කොබෙයිගනේ | 6139 | |
| බිංගිරිය | 6142 | |
| බමුණාකොටුව | 6149 | |
| මාස්පොත | 6151 | |
| කුරුණෑගල | 6154 | |
| මල්ලවපිටිය | 6157 | |
| මාවතගම | 6160 | |
| රිදීගම | 6163 | |
| වීරඹුගෙදර | 6166 | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය |
|---|---|---|
| කුලියාපිටිය නැගෙනහිර | 6169 | |
| කුලියාපිටිය බටහිර | 6172 | |
| උඩුබද්දාව | 6175 | කුරුණෑගල |
| පන්නල | 6178 | |
| නාරම්මල | 6181 | 18 |
| අලව්ව | 6184 | |
| පොල්ගහවෙල | 6187 | |
| පඩුවස්නුවර නැගෙනහිර | 6190 | |
| පඩුවස්නුවර බටහිර | 6193 | |
| කල්පිටිය | 6203 | |
| වනාතවිල්ලුව | 6206 | |
| කරුවලගස්වැව | 6209 | |
| නවගත්තේගම | 6212 | පුත්තලම |
| පුත්තලම | 6215 | |
| මුන්දලම | 6218 | |
| මහකුඹුක්කඩවල | 6221 | 19 |
| ආණමඩුව | 6224 | |
| පල්ලම | 6227 | |
| ආරච්චිකට්ටුව | 6230 | |
| හලාවත | 6233 | |
| මාදම්පෙ | 6236 | |
| මහවැව | 6239 | |
| නාත්තන්ඩිය | 6242 | |
| වෙන්නප්පුව | 6245 | |
| දංකොටුව | 6248 | |
| පදවිය | 7103 | |
| කැබිතිගොල්ලෑව | 7106 | |
| මැදවච්චිය | 7109 | |
| මහවිලච්චිය | 7112 | |
| මධ්‍යම නුවරගම්පළාත | 7115 | |
| රඹෑව | 7118 | අනුරාධපුරය |
| කහටගස්දිගිලිය | 7121 | |
| හොරොව්පතාන | 7124 | |
| ගලෙන්බිඳුනුවැව | 7127 | |
| මිහින්තලේ | 7130 | |
| නැගෙනහිර නුවරගම්පළාත | 7133 | 20 |
| නච්චදූව | 7136 | |
| නොච්චියාගම | 7139 | |
| රාජාංගනය | 7142 | |
| තඹුත්තේගම | 7145 | |
| තලාව | 7148 | |
| තිරප්පනේ | 7151 | |
| කැකිරාව | 7154 | |
| පළුගස්වැව | 7157 | |
| ඉපලෝගම | 7160 | |
| ගල්නෑව | 7163 | |
| පලාගල | 7166 | |
| හිඟුරක්ගොඩ | 7203 | පොළොන්නරුව |
| මැදිරිගිරිය | 7206 | |
| ලංකාපුර | 7209 | |
| වැලිකන්ද | 7210 | 21 |
| දිඹුලාගල | 7212 | |
| තමන්කඩුව | 7215 | |
| ඇලහැර | 7218 | |
| මහියංගනය | 8103 | |
| රිදීමාලියද්ද | 8106 | |
| මීගහකිවුල | 8109 | |
| කන්දෙකැටිය | 8112 | බදුල්ල |
| සොරණාතොට | 8115 | |
| පස්සර | 8118 | |
| ලුණුගල | 8119 | 22 |
| බදුල්ල | 8121 | |
| හාලිඇල | 8124 | |
| ඌව පරණගම | 8127 | |
| වැලිමඩ | 8130 | |
| බණ්ඩාරවෙල | 8133 | |
| ඇල්ල | 8136 | |
| හපුතලේ | 8139 | |
| හල්දුම්මුල්ල | 8142 | |
| බිබිල | 8203 | |
| මඩුල්ල | 8206 | |
| මැදගම | 8209 | |
| සියඹලාණ්ඩුව | 8212 | මොණරාගල |
| මොණරාගල | 8215 | |
| බඩල්කුඹුර | 8218 | 23 |
| බුත්තල | 8221 | |
| වැල්ලවාය | 8224 | |
| කතරගම | 8227 | |
| තණමල්විල | 8230 | |
| සෙවනගල | 8233 | |
| ඇහැලියගොඩ | 9103 | |
| කුරුවිට | 9106 | |
| කිරිඇල්ල | 9109 | |
| රත්නපුර | 9112 | |
| ඉඹුල්පෙ | 9115 | රත්නපුර |
| බලංගොඩ | 9118 | |
| ඕපනායක | 9121 | |
| පැල්මඩුල්ල | 9124 | 24 |
| ඇලපාත | 9127 | |
| අයගම | 9130 | |
| කලවාන | 9133 | |
| නිවිතිගල | 9136 | |
| කහවත්ත | 9139 | |
| ගොඩකවෙල | 9142 | |
| වැලිගෙපොල | 9145 | |
| ඇඹිලිපිටිය | 9148 | |
| කොලොන්න | 9151 | |
| රඹුක්කන | 9203 | |
| මාවනැල්ල | 9206 | |
| අරණායක | 9209 | කෑගල්ල |
| කෑගල්ල | 9212 | |
| ගලිගමුව | 9215 | |
| වරකාපොල | 9218 | 25 |
| රුවන්වැල්ල | 9221 | |
| බුලත්කොහුපිටිය | 9224 | |
| යටියන්තොට | 9227 | |
| දෙහිඕවිට | 9230 | |
| දැරණියගල | 9233 | |

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත ලිඛිත තරග විභාගය - 2018 (2019)

ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

*ලිඛිත විභාගය.*-මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර හතරකින් (04) සමන්විත වේ.

| *විෂය අංකය* | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු* |
|---|---|---|---|---|
| 1 | සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | පැය 02 | 100 | 40 |
| 2 | පරිපාලනය හා කළමනාකරණය | පැය 01 | 100 | 40 |
| 3 | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | පැය 01 1/2 | 100 | 40 |
| 4 | ශ්‍රී ලංකාවේ හරයාත්මක සහ කාර්යය පටිපාටික නීති | පැය 01 | 100 | 40 |

*විභාග දිනය* - මෙම විභාගය 2019 මැයි මස දී පහත සඳහන් උපලේඛන 01 හි දක්වා ඇති නගරයන්හි පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වෙනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

මෙම විභාගය උපලේඛනය - I හි දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලැබේ. එම උපලේඛනයට අනුව විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තුවන නගරය තෝරාගත යුතු අතර අයදුම්පතේ විභාගයට පෙනී සිටින නගරය හා ඊට අදාළ නගර අංකය උපලේඛනය - I අනුව නිවැරදිව සඳහන් කළ යුතුය.

අයදුම්පතේ විභාගයට පෙනී සිටීමට සඳහන් කර ඇති නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරය හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලබන අතර විභාගයට අයදුම්කරන අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

*සම්මුඛ පරීක්ෂණය* :-

විභාගයේ සියලු විෂයන් සමත් අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාගේ සිට පහළට ලකුණු අනුපිළිවෙළ අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු එකී විභාගය සඳහා වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත් කළ හැකිය. එසේ වුවද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකිය.

02. *සේවා කොන්දේසි* :-

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන අති *විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ තනතුරු විශ්‍රාම වැටුප් සහිත බව ඉහතින් දක්වා තිබුණ ද අනාගතයේදී බඳවා ගනු ලබන ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණියට පත්වන නිලධාරින් සම්බන්ධයෙන් ඔවුන්ට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය හා/ හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය අනුව නිර්ණය කරනු ලැබේ.

2.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගෙන වසර 06 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ 8.13 හි සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 ට සහ ඊට කරනු ලබන සංශෝධනයන්ට අනුකූලව අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 396 සහ ඊට කරනු ලබන සංශෝධනයන්හි සඳහන් පරිදි ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියට අදාළ මට්ටම අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

2.5 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

03. *මාසික වැටුප් පරිමාණය* : අංක 03/2016 හා ඊට අනුරූපව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016.06.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 386 අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය (MN 7-2016) 41,580 - 11 x 755 - 18 x 1,030 - 68,425 (ආරම්භක වැටුප් පියවර 03 - රු.43,090) ක් වන අතර එම වැටුප ඔබට හිමිවන්නේ 2020.01.01 දින සිට වේ. ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. *බඳවා ගැනීමේ සුදුසුකම්* :
උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(අ) i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම
ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත වීම
iii. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂ-කයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස දිවුරුම් දී තිබීම.

හෝ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව පිළිගනු ලබන සුදුසුකමක් ලබා තිබීම.

සටහන - ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස දිවුරුම් දී ඇති දිනය හෝ උපාධිය බලපවත්නා දිනය අයදුම්පත් කැඳවන අවසන් දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතුය.

(ඈ) වයස : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

''ඒ අනුව 1997.02.08 දිනට හෝ ඊට පෙර හා 1974.02.08 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.''

(දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිරත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

සැ.යු - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් ගැසට් පත්‍රයේ දිනය වන 2019 පෙබරවාරි මස 08 වෙනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

05. විභාග ගාස්තු - විභාග ගාස්තු රු. 600/- කි. මෙම මුදල "අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වේල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යන ගිණුම් අංක 297100199025039 ට බැර කර ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මඟින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.)

06. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12" (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරුලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය.

ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප විය හැක.

(ආ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතුය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2019 මාර්තු මස 11 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට එවිය යුතුය.

ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පවත්වන විවෘත ලිඛිත තරග විභාගය - 2018 (2019)" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාර ගනු නොලැබේ.

(ඈ) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබිය යුතුය.

(ඉ) අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) ඉල්ලුම් පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබිණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් මෙම විස්තර සමඟ ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, 011 - 2784232 දරන ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායි වනු ඇත. තවද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කිසිම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරන බව ද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

07. විභාගයට ඇතුළත්වීම.

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ ඉල්ලුම් පත්‍ර එවා ඇති අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රය ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

සටහන - අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

08. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

09 සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

10. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

11. *(අ)* විභාගය සිංහල, දෙමළ යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

*(ආ)* අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් උපාධිය ලබා ගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය.

*(ඇ)* අපේක්ෂකයකු සුදුසුකම්ලත් උපාධියේ විෂයයන්, භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේදී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

*(ඈ)* ප්‍රධාන විෂයය එක භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකින් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාග යට පෙනී සිටිය යුතුය.

*සටහන* -
i. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
ii. තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.
iii. විභාග ප්‍රතිඵල - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් මගින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් සිදුකෙරෙනු ඇත.

12. *ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය* :

(i) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය :-
ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර තලයේ සමාජ, ආර්ථික, සංස්කෘතික සහ දේශපාලනික වශයෙන් වැදගත් වන කාලීන සිදුවීම් මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික සංවර්ධනය පිළිබඳව අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂා කිරීම සාමාන්‍ය දැනීම ප්‍රශ්නවලින් අපේක්ෂා කෙරේ. අයදුම්කරුගේ තර්කන ශක්තිය මැනීම බුද්ධි පරීක්ෂණ ප්‍රශ්නවලින් අපේක්ෂා කෙරෙන අතර එකී ප්‍රශ්න සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවයන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලුවලින් සමන්විතය.

(ii) පරිපාලනය හා කළමනාකරණය :-

පරිපාලන/කළමනාකරණ ක්ෂේත්‍රය තුළ ඇති විය හැකි සිද්ධි/ගැටලු කිහිපයක් ඉදිරිපත් කර එම සිද්ධිවලට/ගැටලු වලට ප්‍රතිචාර දැක්වීම හා එකී සිද්ධි/ගැටලු නිරාකරණය කිරීම සඳහා අපේක්ෂකයා සතු න්‍යායික සහ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම අරමුණු කර ගත් ප්‍රශ්න ඉදිරිපත් කරනු ඇත.

(iii) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව :-
මෙම ප්‍රශ්න පත්‍රය අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයට සමාන වන අයුරින් සකස් කෙරෙනු ඇත. ඒ හා සමාන දැනුමක් මෙයින් අපේක්ෂා කෙරේ.

(iv) ශ්‍රී ලංකාවේ හරයාත්මක සහ කාර්ය පටිපාටික නීති :-

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීති
- පුද්ගල නීති
- අධිකරණ සංවිධාන පනත
- සාක්ෂි ආඥාපනත
- දණ්ඩ නීති සංග්‍රහය
- අපරාධ නඩු විධාන සංග්‍රහය පනත
- සිවිල් නඩු විධාන සංග්‍රහය

පිළිබඳ අවබෝධය මෙයින් අපේක්ෂා කෙරේ.

*සටහන* : සෑම ලිඛිත පිළිතුරු පතකම අපැහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත.

13. මෙහි සිංහල , දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්. සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2019 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත ලිඛිත තරග විභාගය - 2018 (2019)**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මාධ්‍යය —
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

*ගැසට්* නිවේදනය අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න. (විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක සඳහා උපලේඛන - I බලන්න.)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

02. පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

2.2 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————. මයා/මිය/මෙය
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා : SIRIWARDANA , A.P.K.

2.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 කාර්යාල ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :————.

2.5 කාර්යාල ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :————.

2.6 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :————.

2.7 පදිංචි දිස්ත්‍රික්කය :————.

2.8 ස්ත්‍රී පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.9 ජාතික හැඳුනුම්පත් අංකය :

2.10 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.11 උපන් දිනය :————.

වර්ෂය : මාසය : දිනය :

2.12 2019.02.08 දිනට වයස :

අවුරුදු : මාස : දින :

2.13 දුරකථන අංකය :

ස්ථාවර : ජංගම :

03. අධ්‍යාපන සුදුසුකම්:

(අ) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස දිවුරුම් දුන් දිනය :————.

(ආ) උපාධිධාරී අයදුම්කරුවකු නම්,
1. උපාධිය :————.
2. උපාධිය සම්පූර්ණ කළ දිනය :————.
3. විශ්වවිද්‍යාලය :————.

(ඇ) ඊට සමාන අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් :
1. විශ්වවිද්‍යාලය/ ආයතනය :————.
2. සුදුසුකම් :————.
3. සුදුසුකම් සම්පූර්ණ කළ දිනය :————.

04. වෙනත් සුදුසුකම් : ..........................................................................................................................

05. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐

..........................................................................................................................

06. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර:
විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
ලදුපත් අංකය හා දිනය :————.
ගෙවූ මුදල :————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) |

07. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය විඳ දරාගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලු කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

08. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී .................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

මෙම .......................... සේවය කරන .......................... මයා/මිය/මෙනවියට ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණිය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදාහරින බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවද ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමග ඉදිරිපත් කරමි.

දිනය :————.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව :————.

උපලේඛනය - I

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

02-560

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.